# මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය භාරය

දිගු කලක් පැවති අවශ්‍යතා වන් සපුරාලමින් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවනු ලැබිණ. මෙම පනත අනුව මධ්‍යම පරිසර අධිකාරියට පරිසර සංරක්ෂණයේ හා කළමනාකරණයේ දී ව්‍යවස්ථාපිත කාර්ය භාරයක් හිමිවේ.

මධ්‍යම පරිසර අධිකාරිය සතුවන මෙම කාර්ය භාරය පරීක්ෂා කර බැලීමට ප්‍රථමයෙන් මෙවැනි පනතක් සහ මෙම අධිකාරියත් ඇතිවීමට පසුබිම් වූ කරුණු පිළිබඳව සළකා බැලීම යෝග්‍යයැයි සිතමි. මෑත කාලයේදී විශේෂයෙන් නිදහස ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ කඩිනම් සංවර්ධනයක් ඇති කරලීම සඳහා වැඩ සටහන් රාශියක් දියත් කරන ලදී. යටත් විජිත යුගයේ සිට පැවත ආ පාරිසරික ගැටළු නිදහස ලැබීමත් සමග ආරම්භ කරන ලද සංවර්ධන යෝජනා ක්‍රම හේතු කොට ගෙන ක්‍රමයෙන් උග්‍ර අතට හැරී යන ආකාරයක් දක්නට ලැබුණි, ශීඝ්‍ර ජනගහණ වර්ධනය, නාගරීකරණය, සැලසුමකින් තොර සංවර්ධන ක්‍රියාවලින් ආරම්භ කිරීම වැනි හේතූන් මත අපගේ භෞතික සම්පත් පදනමට හා පරිසරයට ප්‍රබල තර්ජනයක් එල්ලවන ආකාරය 1980 වනවිට පැහැදිලිව දක්නට ලැබුණි. කාර්මීකරණය සහ නාගරීකරණය හේතු කොට ගෙන ඇති වූ පරිසර දූෂණය උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වූ අතර ජල දූෂණය, පස සේදීයාම හා පසේ සරුබව අඩුවී යාම, කැළිකසළ නිසි පරිදි බැහැර නොකිරීම වැනි පාරිසරික ගැටළු රැසක්ම දක්නට ලැබුණි. සංවර්ධන ක්‍රියාවලීන් මෙන්ම අනවසර දූව කැපීම් හේතු කොට ගෙන අපගේ වන සම්පත් ඉතා විශාල වශයෙන් අඩු වී ගිය අතර වන සත්ත්ව සම්පත ද වඳ වී යාමේ තර්ජනයකට මුහුණ පෑවේය. මෙම කාලසීමාව තුළ සමස්ත පරිසර සංරක්ෂණය හා කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන නීතියක් හෝ ආයතනයක් නොතිබුණි.

කෙසේ වෙතත් 1980 ට පෙර පරිසරයට ඇතුළත්වන වනාන්තර, වනසතුන් වැනි විවිධ අංශවලට අදළ නීති සහ ආයතන රැසක්ම දක්නට ලැබුණු අතර ප්‍රධාන අඩුපාඩුවක්ම පැවතියේ මෙම පරිසර කටයුතු සමායෝජනය කරන කේන්ද්‍රීය ආයතනයක් නොමැතිකමයි. මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමෙන් මෙම අඩුව සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු විය. 1978 ව්‍යවස්ථාව මගින් පරිසර සංරක්ෂණය හා කළමනාකරණය රජයේ මෙන්ම සමස්ත ජනතාවගේම වගකීමක් වශයෙන් ප්‍රකාශයට පත් කළේය. ඒ අනුව පරිසරය ආරක්ෂා කිරීමේ රාජ්‍ය වගකීම පැවරෙන ආයතනය බවට මධ්‍යම පරිසර අධිකාරිය පත් විය.

---

මධ්‍යම පරිසර අධිකාරියේ
ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ

**තිලක් හේවාවසම්**
**විසිනි.**

---

ජාතික පාරිසරික පනතට අනුව පරිසරය ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වූ පුළුල් වගකීම මධ්‍යම පරිසර අධිකාරියට පැවරෙන අතර මෙම පනත අනුව පරිසර අධිකාරියේ කාර්ය භාරය වන්නේ පරිසර කටයුතු සම්බන්ධීකරණය කිරීම, පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම, සමීක්ෂණ හා විමර්ෂණ පැවැත්වීම, පරිසර කටයුතු සඳහා සැලසුම් සකස් කිරීම, පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමිති සහ උපමාන තීරණය කිරීම සම්බන්ධයෙන් පරිසරය පිළිබඳ ජනතා අවබෝධය වැඩි දියුණු කිරීම සහ අදළ ආයතන සමග සම්බන්ධතාවන් ඇති කර ගැනීම යනාදියයි.

මෙහිදී විශේෂයෙන් කැපීපෙනෙන ලක්ෂණයක් වන්නේ පරිසරය ආරක්ෂා කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියට නීතිමය බලතල කිසිවක් හිමි නොවීමය. මෙම කාර්ය භාරය ඉටු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් විශේෂ ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබීය. මේ අනුව පරිසරය සම්බන්ධයෙන් ජනතාවගේ දැනුම වැඩිදියුණු කිරීම හා පරිසර අධ්‍යාපනය නංවාලීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. එමෙන්ම සමීක්ෂණ අධ්‍යයනයන් මගින් පරිසරය පිළිබඳ තොරතුරු සහ දත්ත ලබා ගැනීම සහ පරිසරාත්මක කටයුතු කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබීය.

1987 දී පරිසර සංරක්ෂණය සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ, පරිසර අධිකාරියේ ක්‍රියාමාර්ග සහ කාර්ය භාරය විමර්ෂණ කළ රජය මධ්‍යම පරිසර අධිකාරියට නව බලතල ලබා දී එහි කාර්ය භාරය පුළුල් කළ යුතු බව තීරණය කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1988 දී නව සංශෝධන පනතින් මධ්‍යම පරිසර අධිකාරියට නීතිමය බලතල ලැබුණි. මේ අනුව පරිසර දූෂණය පාලනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටියක් මෙහෙයවීමට නව ව්‍යාපෘති මගින් පරිසරයට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා පරිසර බලපෑම් තක්සේරුවක් සියලුම යෝජිත සංවර්ධන ව්‍යාපෘතිවලට ඇතුළත් විය යුතු යැයි ප්‍රකාශ වෙන නීතියක් ද හඳුන්වා දෙන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය භාරය සංශෝධිත පනතේ ප්‍රකාශිත රෙගුලාසි මත තීරණය වෙයි. මෙම කාර්ය භාරය ඉෂ්ට කිරීම සඳහා එමෙන්ම මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස්දීම සඳහා පාරිසරික සභාවක් ඇත. මෙම පාරිසරික සභාව සංවර්ධනය හා සම්බන්ධිත අමාත්‍යාංශයන්හි නියෝජිතයන්ගෙන්, පරිසරය හා සම්බන්ධිත රාජ්‍ය නොවන ආයතනවල නියෝජිතයන්ගෙන් සහ පරිසරය පිළිබඳ විශේෂඥයන්ගෙන් සමන්විත වෙයි.

පරිසර අධිකාරියේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා එය ප්‍රධාන අංශ 6 කට බෙදා ඇති අතර මින් පරිපාලන සහ මුදල් අංශ අධිකාරියේ පරිපාලන සහ මූල්‍ය කටයුතු මෙහෙයවනු ලබයි.

**1. පරසර සංරක්ෂණ අංශය :**

පරිසර දූෂණය වැළැක්වීම මෙහි ප්‍රධානතම කටයුත්ත වන අතර, කර්මාන්තශාලා සහ වෙනත් ආයතන මගින් ඇති කරන පරිසර දූෂණය වැළක්වීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම ක්‍රියාත්මක කරනු ලැබේ.

(28 පිටුව බලන්න)

# මධ්‍යම පරිසර අධිකාරියේ .......

(10 වැනි පිටු වෙන් ඉතිරි)

2. **ස්වාභාවික සම්පත් කළමනාකරණ අංශය :**
   ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ එම කටයුතු සමායෝජනය කිරීම හා අධ්‍යයනයන් මෙහෙය වීමට අවශ්‍ය නිරීක්ෂණ කිරීම .

3. **ක්‍රමසම්පාදන අංශය :**
   පරිසරය පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අන්තර් ජාතික ආයතන සමග සම්බන්ධතාවන් පැවත්වීම, පරිසර ප්‍රතිපත්ති, නීති සහ දත්ත තොරතුරු සම්පාදනය පාරිසරික ක්‍රම සම්පාදනය,

4. **පරිසර ප්‍රවර්ධන අංශය :**
   පරිසරය පිළිබඳ ජනතාවගේ දැනුම වැඩි දියුණු කිරීම, පරිසර අධ්‍යානයට මෙහෙයවීම.

මේ හැරුණුවිට ජාතික පාරිසරික පනත මගින් සෑම දිස්ත්‍රික්කයකම දිසා පාරිසරික අනුයෝජිත ආයතන පිහිටුවීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇති අතර, මෙහි සභාපති ලෙස කටයුතු කරනු ලබන්නේ දිසාපතිවරයාය. දිස්ත්‍රික්කයේ පරිසර සංරක්ෂණයට අදාළ වන ආයතනවල නිලධාරීන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන්ගෙන් සමන්විත වන මෙම කමිටුවල මූලික කාර්‍ය්‍ය භාරය වන්නේ දිස්ත්‍රික්කය තුළ පරිසර කටයුතු සමායෝජනය කිරීම, සමීක්ෂණ සහ අධ්‍යයනයන් පැවැත්වීම හා තොරතුරු එක්රැස් කිරීම සඳහා අදාළ ආයතන මෙහෙයවීමත්ය.

මධ්‍යම පරිසර අධිකාරිය මෑතකදී ආරම්භ වූ කුඩා ආයතනයක් වන නමුත්, එයට පැවරී ඇති කාර්‍ය්‍ය භාරය අති විශාලය. එම කාර්‍ය්‍ය භාරය වඩා ක්‍රමවත් අයුරු පවත්වා ගෙන යාම සඳහා ස්වකීය හැකියාවන් වර්ධනය කරගැනීමේ අවස්ථාවක අධිකාරිය දැනට නිරත වී ඇත. ස්වකීය මූලධර්ම ශක්තිය සේවක නිපුනතාවය වර්ධනය කර ගැනීමෙන් මෙන්ම නීතිමය පදනම තව දුරටත් ශක්තිමත් කරගැනීමෙන් දිවසිටි සමාජ පදනම ආරක්ෂාකර ගැනීමත් ස්වභාවික පරිසරය සංරක්ෂණය කර ගැනීම සඳහා මධ්‍යම පරිසරයට පැවරී ඇති කාර්ය භාරය වඩා ඵලදායි හා කාර්යක්ෂම ආකාරයකින් ඉටුකර ගැනීමට හැකි වෙතැයි අවධාරණයෙන් අපේක්ෂා කෙරේ.